NALANDA VIDYALAYA **නාලන්දා විද්‍යාලය - කොළඹ 10** NALANDA VIDYALAYA

NALANDA VIDYALAYA **ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය** NALANDA VIDYALAYA

| 9 ශ්‍රේණිය | ගණිතය | ඒකකය: 10 අනුලෝම සමානුපාත |
|---|---|---|

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**01).**

පහත දී ඇති සමානුපාතවල හිස්තැනට ගැළපෙන අගයන් සොයන්න.

(1) 2 : 3 = 6 : ☐  (2) 5 : 4 = ☐ : 20  (3) ☐ : 2 = 8 : 16

(4) 7 : ☐ = 28 : 20  (5) 6 : ☐ = 18 : 15

**02).**

පහත සඳහන් එක් එක් අවස්ථාවේ දැක්වෙන රාශීන් දෙක අනුලෝම වශයෙන් සමානුපාත වේ නම් ඊට යටින් ඉරක් අඳින්න.

(1) ගමන් කළ දුර හා වැය වූ පෙට්‍රල් ලීටර් ප්‍රමාණය

(2) රථය ගමන් කළ වේගය හා වැය වූ කාලය

(3) සමචතුරස්‍රයක පැත්තක දිග හා එහි වර්ගඵලය

(4) නිවස තැනීමට යෙදවූ මිනිසුන් ගණන හා ගත වූ කාලය

(5) සමාන සිසුන් ප්‍රමාණයක් සිටින පන්ති දෙකක සිසුන් ප්‍රමාණය හා පන්ති අටක සිසුන් ප්‍රමාණය

(6) ළිඳක් කැපීමට වැය කළ දින ගණන හා යෙදවූ මිනිසුන් සංඛ්‍යාව

**03).**

පහත සඳහන් ගැටලු ඒකීය ක්‍රමය භාවිතයෙන් විසඳන්න.

(1) යකඩ 300$g$ ක මිල රු. 24/= ක් නම්, යකඩ 500$g$ ක මිල සොයන්න.

(2) චීත්ත රෙදි 8$m$ ක මිල රු. 960/= ක් නම්, චීත්ත රෙදි 5$m$ ක මිල සොයන්න.

(3) පොල් ගෙඩි 30 ක මිල රු. 1440/= ක් නම්, පොල් ගෙඩි 18 ක මිල සොයන්න.

(4) 7$m$ ක් දිග කම්බි කූරක ස්කන්ධය 1.12$kg$ ක් වේ. එම වර්ගයේ 4$m$ ක් දිග කම්බි කූරක ස්කන්ධය සොයන්න.

(5) රු. 1800/= ක සපත්තු ජෝඩුවක් සඳහා රු. 360/= ක වට්ටමක් ලැබෙන්නේ නම්, රු. 2400/= ක සපත්තු ජෝඩුවක් සඳහා ලැබෙන වට්ටම කොපමණ ද?

EXAMRESULTS.LK

**04).**

එක්තරා දිනක විනිමය අනුපාතිකයන් පහත වගුවේ දැක්වේ.

| විදේශ මුදල් ඒකක | ශ්‍රී ලංකා රුපියල්වලින් වටිනාකම |
|---|---|
| ඇමරිකන් ඩොලර් 1 | රු. 113.10 |
| බහරේන් ඩිනාර් 1 | රු. 282.10 |
| යූරෝ 1 | රු. 142.70 |
| ජපන් යෙන් 1 | රු. 1.10 |
| ඕමාන් රියාල් 1 | රු. 273.40 |
| පාකිස්ථාන් රුපියල් 1 | රු. 1.40 |
| ස්ටර්ලින් පවුම් 1 | රු. 168.75 |
| ඕස්ට්‍රේලියන් ඩොලර් 1 | රු. 76.25 |

පහත දැක්වෙන එක් එක් විදේශ මුදල් ප්‍රමාණ බැංකුවට ඉදිරිපත් කිරීමෙන් ලබා ගත හැකි ශ්‍රී ලංකා රුපියල් ප්‍රමාණය සොයන්න.

(1) ඇමරිකන් ඩොලර් 1200 ක්
(2) බහරේන් ඩිනාර් 600 ක්
(3) යූරෝ 500 ක්
(4) ජපන් යෙන් 5400 ක්
(5) ඕමාන් රියාල් 400 ක්
(6) පාකිස්ථාන් රුපියල් 1800 ක්
(7) ස්ටර්ලින් පවුම් 750 ක්
(8) ඕස්ට්‍රේලියන් ඩොලර් 1050 ක්

**වසන්ත වඩුගේ (BSc. PGDE)**